# අකුණු



චෙනුති නෙලින්‍යා

# අකුණු

## චෙනුති නෙලින්යා.

කර්තෘ

කර්තෘ ප්‍රකාශනයකි.
සියලුම හිමිකම් කර්තෘ සතුය.

කර්තෘගේ වෙනත් කෘති : ★ හා පැංචිගේ මැණික
★ හිත හොඳ පූස් රාළ

කතාව හා චිත්‍ර

චෙනුති නෙලින්යා.
4 ශ්‍රේණිය D
මහ/මහාමායා බාලිකා විදුහල
මහනුවර.

ප්‍රථම පළ කිරීම

2026 මැයි 10

ISBN : 978-624-211-351-7

# පිදුම

**මගේ ආදරණීය**

**මහාමායා මැණියන් ට**

**සෙනෙහසින්.........**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරට ට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මග පෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර.
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය,පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
**2026-05-10**

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව,විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.


ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
**2026.05.10**

දවසක් හවස මලිති ජනේලයෙන් දැක්කා, අහස කළු වෙලා තියෙනවා. වලාකුළු අඳුරු වෙලා.... වහින්න හදන්නේ, මලිතිට හිතුණා.



පරිසරය වෙනස් වන දිහා බලාගෙන හිටපු මලිතිට මතක් වුණා රෙදි වැලේ රෙදි තියෙනවා කියලා. ඒ වගේම,ගම්මිරිස් වට්ටිය වේලෙන්න දැම්මා කියලා.

එයා අම්මා හොයාගෙන කුස්සියට දිවුවා.



“අම්මේ, වහින්න හදන්නේ ඉක්මනට රෙදි වැලේ රෙදි ගමු.” අම්මා, මලිති එක්ක එකතු වෙලා රෙදි වැලේ රෙදි ගත්තා. “දුවේ, ඉක්මනට ගම්මිරිස් වට්ටිය ගෙට ගන්න.” අම්මා කිව්වා.



ඊට පස්සේ මලිති ආයෙත් ජනේලයෙන් වටපිට බැලුවා.
කුරුල්ලන්ගේ හඬ ඇහෙන්නේ නෑ...
ගස් වල අතු කැරකිලා ලොකු හුළඟක් හැමුවා.
මලිතිට සීතලක් දැනුණා.



මලිති අහස වෙනස් වෙන දිහා පුදුමයෙන් බලා සිටියා. එකපාරටම ලොකු ශබ්දයක් එක්ක අහසෙන් එළියක් ආවා.
මලිති හොඳටම බය වෙලා කෑ ගැහුවා.
“අම්මේ, ඉක්මනට එන්න...” මලිති හයියෙන් කෑ ගැහුවා.



මලිතිගේ කෑ ගැහිල්ල ඇහුණ අම්මා හොඳටම බය වෙලා සාලයට දුවගෙන ආවා... "ඇයි දුවේ කෑ ගහන්නේ ?" මලිතිගේ මූණ දැක්ක අම්මා තවත් බය වුණා.



“අම්මේ, අහසින් පොළොවට එළියක් එනවා මම දැක්කා. ඒ ලයිට් නේද?” මලිති ඇසුවා.
“නෑ දුවේ, ඒ ලයිට් නෙවෙයි. ඒ අකුණක්...” අම්මා කිව්වා.




“අම්මේ, අකුණක් කියන්නේ මොකක් ද?” මලිති ඇහුවා.

“අපි විදුලි කොටනවා, හෙණ ගහනවා කියලා කියන්නේ ඒවාට. මම ඔයාට අකුණු ගැන කියලා දෙන්නම්.”



අකුණු කියන්නේ, අහසේ ඇතිවන ඉතා විශාල විදුලි පුපුරකටයි. මෙහි දී සිදුවන්නේ, අහස ගොරව ගොරව වහින කොට වළාකුළු හා පොළොව අතර සිදුවෙන ක්‍රියාවකින් පොළොව දෙසට විදුලිය නිකුත් කරන එක. එතකොට ලොකු උණුසුමක් ඇති වෙනවා. ඒ නිසා අවට වාතය රත් වෙලා ඉවත් වෙනවා. එතකොට තමයි අපට ගිගුරුම් හඬ ඇසෙන්නේ.




ආලෝකයේ වේගය ශබ්දයේ වේගයට වඩා වැඩි නිසා තමයි අපිට මුලින් අකුණු එළිය පෙනිලා පසුව ගිගුරුම් හඬ ඇසෙන්නේ.



“අකුණු වලින් මිනිසුන්ටයි සතුන්ටයි හානි සිදු වෙනවා. ඒ නිසා අකුණු වලට ස්වභාවික විපතක් කියලාත් කියනවා. අපි අකුණු වලින් ආරක්ෂා වෙන්න ඕන.” අම්මා කිව්වා.
“අකුණු වලින් බේරෙන්න අපි මොනවද? කරන්න ඕනේ අම්මේ ?...”



විදුලි කොටන වෙලාවට අපි ටී.වී. බලන්න, දුරකථනයෙන් කතා කරන්න, විදුලි උපකරණ පාවිච්චි කරන්න, හොඳ නැහැ. ඒ වගේ ම පිට්ටනියක ඇති තනි ගසක් යට ඉන්නත් හොඳ නැහැ. කියලා අම්මා මලිතිට කියලා දුන්නා.



"අම්මේ, මම දැන් අකුණු ගැන ගොඩක් දේවල් දන්නවා. මම ආයෙත් විදුලි කොටන කොට බය වෙන්නේ නෑ... මම මගේ යාළුවන්ටත් අකුණු ගැන කියලා දෙන්නම්" මලිති අම්මාට තුරුලු වෙමින් කිව්වා...





නිමි.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උර දී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් " හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN : 978-624-211-351-7